# අග්ගඤ්ඤ සූත්‍රානුගත මනස පිළිබඳ  විග්‍රහය හා ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාවෙහි මනස කේන්ද්‍ර කරගත් සංකල්පය අතර පවතින සම විෂමතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ. ජී. එස්. උපනන්ද[1], ඩබ්. දිලානි සාගරිකා විමලසේන[2],

එස්. ඒ. ඒ. නිමාෂි[3], බී. එම්. ඩී. ඩී. ජේ. වික්‍රමසිංහ[4]

**හැඳින්වීම**

පෙරදිග ආධ්‍යාත්මික ලෝකය තුළ පහළ වූ බුදුදහම මනස මූලික කරගත් ඉගැන්වීමක් වන අතර, එය හුදු දර්ශනයකට හෝ ආගමකට කේන්ද්‍ර නො වන විශ්වීය යථාර්ථවාදය මත පදනම් වූවකි. එහෙත්  පුද්ගල මනස මූලික කරගනිමින්  අපරදිග චින්තනය තුළ ගොඩනැගෙන විධිමත් විෂයමාලාවක් ලෙස බටහිර මනෝවිද්‍යාව පසුකාලීන ව බිහි විය. එකී බටහිර මනෝවිද්‍යාවේ මනස පිළිබඳ කේන්ද්‍රීය ලෙස අධ්‍යයනය කළ එක් ක්ෂේත්‍රයක් ලෙස මනෝවිශ්ලේෂණවාදයෙහි සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ අදහස් පෙන්වා දිය හැකි වේ. ඒ අනුව, බුදුදහමේ අනෙකුත් සූත්‍ර දේශනා අතර, දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි මනස පිළිබඳ සඳහන් වන සංකල්පය හා ඉහත සඳහන් කළ බටහිර ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාවෙහි මනස කේන්ද්‍ර කරගත් සංකල්පය අතර පවතින සම විෂමතා මෙම අධ්‍යයනයේ දී විමර්ශනය කරනු ලබයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී දත්ත ඒකරාශී කිරීම සඳහා ග්‍රන්ථ පරිශීලන ක්‍රමවේදය යටතේ ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යොදාගත් අතර, දත්ත විශ්ලේෂණයේ දී විස්තරාත්මක විශ්ලේෂණයක යෙදී ඇත.

**පර්යේෂණ ගැටලුව**

බුදුදහම කේන්ද්‍ර කර ගනිමින් පෙරදිග තුළ ව්‍යවහාරයට බඳුන් වන මනස පිළිබඳ සංකල්පය විග්‍රහ වන අග්ගඤ්ඤ සූත්‍රයෙහි විග්‍රහය සහ බටහිර මනෝවිද්‍යාවෙහි මනස පිළිබඳ සංකල්ප අතර ෆ්‍රොයිඩ් විසින් සාකච්ඡා කරන ලද මනස පිළිබඳ සංකල්පයෙහි සම විෂමතාවන් පවතී ද? යන්න මෙහි දී සාකච්ඡා කරයි.

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

පද්මසිරි ද සිල්වා මහතා විසින් (1981) බුදුදහම සහ ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාව පිළිබඳ විමර්ශනයක් සිදු කර ඇති අතර, එහිදී ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාව තුළ ඇති බුදුදහමෙහි ආභාසය සහ ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාව සහ බුදුදහමේ අන්තර්ගත කරුණු පිළිබඳ ව සංසන්දනාත්මක ව අධ්‍යයනයක් කර ඇත. ලීසා ඩේල් (2012) විසින් බුදුදහම සහ ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාවේ අවිඥානය පිළිබඳ අධ්‍යයනයක් සිදු

[1]. තෙවන වසර (විශේෂවේදී), කැලණිය විශ්වවිද්‍යාලය. *sanjeewaniupananda@gmail.com*
[2]. තෙවන වසර (විශේෂවේදී), කැලණිය විශ්වවිද්‍යාලය.
[3]. තෙවන වසර (විශේෂවේදී), කැලණිය විශ්වවිද්‍යාලය.
[4]. තෙවන වසර (විශේෂවේදී), කැලණිය විශ්වවිද්‍යාලය.

කර ඇති අතර, එහි දී බුදුදහමෙහි සඳහන් අවිඥානය පිළිබඳ සඞ්කල්පය සහ ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාවේ සඳහන් අවිඥානය පිළිබඳ සඞ්කල්පය සංසන්දනාත්මක ව විග්‍රහ කර ඇත. මේ ආකාරයට දේශීය සහ විදේශීය වශයෙන් බුදුදහම සහ ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාව පිළිබඳ ව විමර්ශනය කර තිබුණ ද අග්ගඤ්ඤ සූත්‍රය පිළිබඳ ව ප්‍රධාන කොට දක්වා නොමැති වීම දක්නට ලැබේ.

**පර්යේෂණ සීමාව**

බුදුදහමේ අග්ගඤ්ඤ සූත්‍රානුගත සඞ්කල්පය සහ බටහිර මනෝවිද්‍යාවේ මනස පිළිබඳ ෆ්‍රොයිඩියානු සඞ්කල්පයට සීමා වේ.

**පර්යේෂණ සාකච්ඡාව**

පෙරදිග චින්තනය තුළ මනස යන සඞ්කල්පයට ප්‍රධාන ස්ථානයක් ලැබුණු අතර, භාරතීය පසුබිම එහි ලා ප්‍රමුඛ ය. එහි දී යථාර්ථවාදී ව මනස පිළිබඳ විග්‍රහයක යෙදුණු ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ ය. බුද්ධදේශනාව ඇතුළත් ත්‍රිපිටක පරියාපන්න සූත්‍ර දේශනා අතර මනස පිළිබඳ ව බොහෝ විග්‍රහයන් දක්නට ලැබේ. විශේෂයෙන් නාම-රූප පිළිබඳ විග්‍රහය, චිත්ත-චෛතසික පිළිබඳ විග්‍රහය යනාදිය පෙන්වා දිය හැකි ය. පසුකාලීන ව බටහිර මනෝවිද්‍යාවේ ආරම්භයත් සමඟ අපරදිග චින්තනයෙහි මනස පිළිබඳ විවිධ අදහස් ඉස්මතු විය. මෙහි දී මනස පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් ලෙස බටහිර මනෝවිද්‍යා ක්ෂේත්‍රය බිහි විය.  එහි පුරෝගාමියෙකු වූ සිග්මන් ෆොයිඩ් විසින් මනෝවිශ්ලේෂණවාදය හඳුන්වා දී ඇත. එහි දී මනස යන සඞ්කල්පය විෂයෙහි විඥානය, උපඥානය, අවිඥානය යන මනසේ ප්‍රධාන ස්තර තුනක් පෙන්වා දී ඇත. කෙසේ වෙතත් බුදුදහම හා බටහිර මනෝවිද්‍යාවේ මනස පිළිබඳ විග්‍රහයන් අතර අග්ගඤ්ඤ සූත්‍රයෙහි අන්තර්ගතය හා මනෝවිශ්ලේෂණවාදයෙහි විග්‍රහයන් මෙහි දී ඉස්මතු කරයි. අග්ගඤ්ඤ සූත්‍රය හා ප්‍රොයිඩ්ගේ න්‍යාය වැනි එකිනෙකට වෙනස් අධ්‍යයන ක්‍රම දෙකක් සංසන්දනය කරන්නේ කවර හෙයින් ද? යන ප්‍රශ්නය මෙහි දී මතුවේ. එයට හේතු කිහිපයකි. ඉන් එකක් නම් ෆ්‍රොයිඩ් පුද්ගල මනස විග්‍රහ කිරීමට යොමු වී ඇත්තේ මානසික රෝගයක් මුල් කොටගෙන වන අතර, බුදුරජාණන් වහන්සේ මනස විග්‍රහ කරන්නේ පොදුවේ සෑම මිනිසෙකු ම පදනම් කරගෙන ය. සෙසු කරුණු නම් මිනිසාගේ සියලු පැතුම්වලට මුල් වන්නේ කාමය යැයි ෆ්‍රොයිඩ් කී අදහසට අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවෙහි අන්තර්ගත කරුණු එකඟ වේ ද? නැද්ද? යන්න යි.  ඒ අනුව මෙම ගැටලුවලට පිළිතුරු ලබා ගැනීම සඳහා පහත පරිදි මෙකී බුදුරජාණන් වහන්සේගේ සහ ප්‍රොයිඩ්ගේ මතයන් විග්‍රහ කළ හැකි ය. ෆ්‍රොයිඩ් විසින් ප්‍රතික්ෂේප කළ ඊශ්වරවාදය සහ අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවෙහි සඳහන් වන මිනිසාගේ ආරම්භය පිළිබඳ සඳහන් කිරීමේ දී ප්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදයට අනුව මිනිසා පරිණාමයත් සමඟ බිහි වන බව ප්‍රකාශ කරයි. එහි දී මැවීම පිළිබඳ සඞ්කල්පය ප්‍රතික්ෂේප කරන ප්‍රොයිඩ් පුද්ගල පරිණාමය පිළිබඳ ව විද්‍යාත්මක ව අර්ථ දක්වයි. අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවෙහි වාසෙට්ඨ-භාරද්වාජ යුවල පුද්ගලයා සම්බන්ධයෙන් ඉදිරිපත් කළ බ්‍රාහ්මණ සඞ්කල්පය බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදී. උන්වහන්සේ විසින් එම සූත්‍ර දේශනාව තුළ පුද්ගල සම්භවය සිදු වන ආකාරය විද්‍යාත්මක ව හෙළි කරන ලදී. මේ අනුව ෆ්‍රොයිඩ්ගේ සහ බුදුරජාණන් වහන්සේගේ මතයන් අතර පුද්ගල සම්භවය පිළිබඳ මතය විෂමතාවන්ගෙන් විනිර්මුක්ත වේ. ෆ්‍රොයිඩ් විසින් තමන්ගේ විවේචනයට ලක් වූයේ අපරදිග ආගම්

පමණක් බව ප්‍රකාශ කර ඇත්තේ මේ හේතුව නිසාවෙන් විය හැකි ය. අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් මනසෙහි වෙනස්වීම පිළිබඳ සඞ්කල්පය සහ ෆ්‍රොයිඩ්ගේ මනස පිළිබඳ සඞ්කල්පයට අනුව අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් වන චතුර්වර්ණ පිළිබඳ සඞ්කල්පයෙහි බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ උපතින් ඔහුගේ කිසිඳු මානසික විකෘතිතාවක් නො පෙන්වන බවත් ඔහුගේ චර්යාවට අනුව පුද්ගලයාගේ යහගුණ හෝ දුර්ගුණ නිරූපණය වන බවත් ප්‍රකාශ කරනු ලැබූහ. **"චෙතනා'හං භික්ඛවෙ - කම්මං වදාමි"** යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි චේතනාව හෙවත් මානසිකත්‍වය පුද්ගල ක්‍රියාවට මූලික වේ. අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් වන පරිදි කුමන කුලයක හෝ වේවා, ඔහු අකුසල නොකරත් ද ප්‍රාණඝාත නොකරත් ද කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී සිටිත් ද කුසල් දහමෙහි යෙදෙත් ද පුණ්‍යක්‍රියාවෙහි යෙදෙත් ද ඔහු යථාර්ථවාදී ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු ලෙස ඉහළ කුලවන්තයෙකු ලෙසත් දේශනා කරනු ලබයි. එමෙන් ම ඉතා ඉහළ කුලයක වුව පුද්ගලයෙක් අකුසලයෙහි නිරත වේ ද පුණ්‍යක්‍රියාවෙන් කුසලක්‍රියාවෙන් බැහැර වේ ද ඔහු නො දැමුණු නො හික්මුණු පහත් කුලයෙහි පුද්ගලයෙකු ලෙස හඳුන්වනු ලබයි. ප්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදය තුළ ද මෙලෙස පුද්ගල මානසිකත්‍වය අනුව ඔහුගේ චර්යාව හැඩගස්වන බව පෙන්වා දී තිබේ. ඒ පිළිබඳ ව ෆ්‍රොයිඩ් විසින් බෙදා වෙන් කළ පුද්ගල මනසේ කොටස් ත්‍රිත්‍වය වන තත්භාවය අහම්භාවය හා උපරි අහම්භාවයෙහි ක්‍රියාකාරීත්‍වය පිළිබඳ දක්වන ලද අදහස් අනුව පෙන්වා දිය හැකි වේ. මෙහි දී සිතෙහි ශිෂ්ටසම්පන්න අදහස් උපදින කොටස තත්භාවය ලෙස හඳුන්වා දී ඇත. තත්භාවය පිළිබඳ හැඟීම් පාලනය කරන්නේ අහම්භාවය යි. මිනිස් සිත තුළ විනිශ්චයකරුවකු වශයෙන් ක්‍රියා කරන තවත් කොටසක් ඇති බව දුටු ෆ්‍රොයිඩ් එය උපරිමභාවය නමින් හැඳින්වීය. එක් එක් පුද්ගලයෙකු තුළ එක් එක් පමණට ඇති තත්භාවය හා අහම්භාවය එකිනෙකට සමීප ව පිහිටි සතුරු රාජ්‍ය දෙකක යුදකඳවුරුවලට සමාන කළ හැකි ය. මේ කඳවුරු දෙකින් එකක් දුර්වල වූ වහා ම අනෙක් කඳවුරේ සෙබලුන් දුබල කඳවුරට කඩා පැන, එය වනසා දැමීම ස්වභාවයෙකි. මිනිසා තුළ ඇති අහම්භාවය දුබල වූ විට ද සිදු වන්නේ මෙයට සමාන දෙයකි. ඉඩ් සංස්කාරය හා තත්භාවය අතර පවත්නා අරගලය නැවක හා එළිමහනක නිරන්තරයෙන් පවත්නා අරගලයකට සමාන බව ප්‍රොයිඩ් පෙන්වා දුන්නේ ය. සම්භාව්‍ය බෙලහීන වූ විට මෙය හරිය මෙය වැරදිය යන අවබෝධය දුරු වී දරුණු ක්‍රියාවන්ට පොළඹවයි. උපතේ දී බිළිඳකු තුළ මෙම සඳහන් කළ සත්භාවය එනම් ඉඩ්ගෙන් පිරී පවතින ගුලියක් වැනි බව ෆ්‍රොයිඩ් පෙන්වා දෙයි. තව ද සියලු ම පුද්ගල පෙළඹවීම හා හැඩ ගැසෙන්නේ ක්‍රියාත්මක වන්නේ ස්වභාවයෙන් ම පුද්ගලයා තුළ සැඟවී ඇති සැපයට ඇති කැමැත්ත නිසා බව *Beond the Pleasure Principle* නමැති කෘතියෙහි ෆ්‍රොයිඩ් පෙන්වා දෙයි. **අග්ගඤ්ඤ සූත්‍රයෙහි දී මෙය වෙනස් වන්නේ ලෝකෝත්පත්ති කතාවත් සමඟ සඳහන් කරන පරිදි මිනිසා පූර්වයෙහි සත්භාවයෙන් යුතු ව කටයුතු කළ අතර, ක්‍රමක්‍රමයෙන් අහම්භාවය නිර්මාණය වීම පිළිබඳ ව දක්වන ලද අදහස් අනුව ය.** ඒ අනුව ප්‍රොයිඩ් සඳහන් කරන ලද ඉඩ් නැමැති නො හික්මුණු අහම්භාවය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූවක් මිස පුද්ගලයා තුළ උපතේ සිට ම නො හික්මුණු ස්වරූපයෙන් පැවති සඞ්කල්පයක් නො වන බව අග්ගඤ්ඤ සූත්‍රය අනුසාරයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. අග්ගඤ්ඤ සූත්‍රය මඟින් ශිෂ්ටසම්පන්න ව යහපතෙහි ජීවත් වූ මිනිසා ක්‍රමක්‍රමයෙන් සිදු වන මානසික වෙනස්වීම් මත ඉඩ් දක්වා ගමන් කරන ආකාරය අග්ගඤ්ඤ සූත්‍රයෙහි දේශනා කර ඇත.

මෙලෙස සඞ්කල්ප දෙක තුළ තත්භාවය සහ අහම්භාවය පිළිබඳ ව එහි ආරම්භය සාකච්ඡා කිරීමෙහි විෂමතාවන් පැවැතිය ද එහෙත් අහම්භාවය ඇතිවන ආකාරය පිළිබඳ ව පහත අයුරින් සාකච්ඡා කරනු ලබයි. මිනිසාගේ ආභ්‍යන්තරික පෙළඹවීම් මනසේ ගැඹුරු පතුලේ හට ගැනෙන බව ප්‍රොයිඩ් පැවසූ විට මනෝවිද්‍යාඥයෝ ඒ අදහසට විරුද්ධ වූහ. නමුත් ෆ්‍රොයිඩ් එහි දී සඳහන් කළේ ද්‍රව්‍යාත්මක දෙයක් නො ව ඇත්ත වශයෙන් ම මනසේ හටගත් යාත්මක ආවේගයන්ගේ ප්‍රභවය හා ශක්තිය පෙන්වීමට උපයෝගී කොට ගත් ආකෘතියකි. එම සඞ්කල්පය තුළින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව නො හික්මුණු නො දැමුණු චර්යාවන් කෙරෙහි පාලනයකින් හා අනුදැනුමකින් තොර ව ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඉඩ් සතුවන බව ප්‍රොයිඩ් ප්‍රකාශ කරන ලදී. මෙහි දී බුදුසමයේ මනෝවිග්‍රහය ගැන සලකන විට මනසෙහි අවිඥානික තත්ත්වයන් ගැන කියවෙන අවස්ථා දැකගත හැකි ය. ඒ අනුව බුදුදහමෙහි තෘෂ්ණාව මනසෙහි ඉඩ් නිර්මාණය වීම සඳහා හේතු වන බව සඳහන් කරන ලදී. මේ හා සමානව මිනිස් ක්‍රියාකාරීත්වයට යොමු කරවන මූලික ප්‍රේරණයන් දෙකක් ගැන ප්‍රොයිඩ්ට කරුණු හෙළි කර ඇත. එනම් ජීවන ආශය සහ මරණ ආශය යි. බුදුදහමෙහි සඳහන් වන කාමතණ්හා, භවතණ්හා සහ විභවතණ්හා අතර දිස්වන අදහසම මෙයින් ද යම්තාක් ප්‍රකට වන අවස්ථා ඇත. මෙලෙස මෙම සඞ්කල්ප පිළිබඳ ව සාකච්ඡා කිරීමෙහි දී එම සඞ්කල්ප අතර පවතින සම විෂමතාවන් පිළිබඳ තවදුරටත් සාකච්ඡා කරනු ලබයි.

**පර්යේෂණ නිගමනය**

බුද්ධදර්ශනය, බටහිරදර්ශනය බිහිවීමට පෙර ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ දර්ශනයේ ඇතුළත් වන මනෝවිද්‍යාත්මක සාධක වර්තමානය වන විට නූතන බටහිර මනෝවිද්‍යාව තුළින් ද ගම්‍ය වන බව පෙනේ. එහි දී අග්ගඤ්ඤ සූත්‍රය අනුසාරයෙන් ගොඩනැගෙන මනෝවිද්‍යාත්මක පසුබිම සහ නූතන ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාවෙහි ඒ හා සමඟ බැඳි සම විෂමතාවන් පිළිබඳ කළ අධ්‍යයනයේ දී බටහිර මනෝවිද්‍යාවෙහි අග්ගඤ්ඤ සූත්‍රයට සමානකම් දක්වන මූලධර්මයන් ඇත්තේ බොහෝ විට සිග්මන් ප්‍රොයිඩ් ඉදිරිපත් කරන ලද මනස පිළිබඳ ව සඞ්කල්පය ඇතුළත් මනෝවිශ්ලේෂණවාදයේ ය. එහි දී ඔහු ද මනසෙහි ස්වේද තුනක් දක්වන අතර, අධ්‍යයනයෙහි දී ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කළ එම මනස පිළිබඳ සඞ්කල්ප සහ අග්ගඤ්ඤ සූත්‍රය දේශනාවන් පිළිබඳ ව සංසන්දනය කිරීමේ දී මෙම සඞ්කල්ප දෙක අතර සාපේක්ෂ වශයෙන් විෂමතාවන්ට වඩා සඞ්කල්ප දෙක අතර සමානතාවක් ඇති බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** බුදුරජාණන් වහන්සේ, අග්ගඤ්ඤ සූත්‍රය, සිග්මන් ෆ්‍රොයිඩ්, මනෝවිශ්ලේෂණවාදය

**මූලාශ්‍රය**


- **අඞ්ගුත්තරනිකාය.** (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- මූර්ති. (2009). **ආගම සහ මියගිය ලෝකය.** මයූර පොත් ප්‍රකාශකයෝ.
- එදිරිසිංහ, දයා සහ හපුආරච්චි, ගාමිණී (2010). **මනෝවිද්‍යාව හා න්‍යාය භාවිතය.** දෙහිවල: වත්මා ප්‍රකාශන.

- මෛත්‍රී මූර්ති හිමි, කරාගොඩ උයන්ගොඩ (2001). **මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය,** කොළඹ: සමයවර්ධන පොත්හල (පුද්ගලික) සමාගම.
- **ත්‍රිපිටකය.** සිංහල පරිවර්තන යෙදවුම.
- **දීඝනිකාය** 3. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මජ්ඣිමනිකාය.** (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- පඤ්ඤාවංස හිමි, මඩවල (2005). **චිත්තවිද්‍යා.** කොළඹ: සමයවර්ධන පොත්හල.